**කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 සැප්තැම්බර් 11 දින ද විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2020 දෙසැම්බර් 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අඹතලේ හංදියේ ස්ථාපිත කර තිබූ ඔරලෝසු කණුව නඩත්තු කිරීමට 2015 වර්ෂයේදී දරන ලද පුනරාවර්ථන වියදම රු.598,000ක් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ ගිණුමට ගිණුම්ගත කිරීම නිවැරදි කර නොතිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුවේ. | ගම්උදා සංකල්පය යටතේ ස්ථාපිත කරනු ලැබූ මෙම ඔරලෝසු කණුවෙහි 2015 වසරේ සිදු කරනු ලැබූ නඩත්තු වියදම වැරදීමකින් වත්කම් ගිණුමට ඇතුළත් කර ඇත. එය 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |
| (ආ) | කසළ ඩෝසර් කිරීම, පස් තුනී කිරීම සහ මාර්ග සැකසීම සඳහා 2019 නොවැම්බර් 26 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව ගෙවිය යුතු රු.913,100 ක් ගිණුම්ගත කර නොතිබුණි | නිවැරදිව ගිනුම්ගත කළ යුතුවීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |
| (ඇ) | කුලී පදනම මත ලබාගෙන තිබූ ටිපර් රථ දෙකක් වෙනුවෙන් 2019 දෙසැම්බර් 14 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ කාලයට අදාළව ගෙවිය යුතු රු.792,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිනුම්ගත කළ යුතුවීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉකුත් වර්ෂය හා ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් සභාවට ලැබුණු එකතු කළ අගය මත බදු මුදලින් ඉඩදිය හැකි බදු වටිනාකම ආදායමට නොගැලපීම හේතුවෙන් ගෙවිය යුතු වැට් බදු රු.206,946 කින් වැඩියෙන් හා වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල පිළිවෙලින් රු.206,946ක් හා රු.75,039 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිනුම්ගත කළ යුතුවීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට භෞතික තොග සත්‍යාපනයක් සිදු නොකර තොග ගිණුමේ රු.56,521,168 ක් වූ ශේෂය අවසාන තොගය ලෙස ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොග සත්‍යාක්ෂණයක් කර අවශ්‍ය ගැලපීම් කළ යුතුවීම. | භෞතිකව පවතින ගබඩා තොගය සත්‍ය වශයෙන් සත්‍යාක්ෂනය කර ගිණුම හා ගැළපීම් සිදුකර 2020 අවසන් ගිණුම සමග නිවැරදි කර ඉදිරිපත් කරමි. |
| (ඊ) | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ගිණුමේ ආරම්භක ශේෂය නිවැරදි කිරීම සඳහා රු.44,050 ක් අදාල වත්කම් ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. | නිවැරදි ලෙස ගිනුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |
| (උ) | සභාවේ ප්‍රධාන ගනුදෙනු සිදුවන ජංගම ගිණුම් 3 ක මුදල් පොත් ශේෂවල එකතුව රු.52,126,242 ක හර ශේෂයක් පැවතුණද, මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂ එකතුව රු.203,132,806 ක් ලෙස දක්වා තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |
| (ඌ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.9,184,387 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.9,736,651 ක් ලෙස දක්වා තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. | සිදුව ඇති වරද නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (එ) | කම්පැක්ටර් රථය වෙනුවෙන් මුද්දර ආදායමින් ගෙවන ලද රු.982,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිනුම්ගත කළ යුතු වීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |
| (ඒ) | කම්පැක්ටර් රථයේ වාරික ගෙවීමේදී ඉකුත් වර්ෂ හා ප්‍රවර්ථන වර්ෂයේදී උසාවි දඩ ආදායමින් හිලව් කරන ලද වියදම ගිණුම්ගත නොකිරීම නිසා සමුච්චිත අරමුදල් ගිණුම රු.310,000 ක් වර්ෂයේ වියදම රු.982,000 ක් හා ලැබිය යුතු උසාවි දඩ රු.1,292,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිනුම්ගත කළ යුතු වීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ප්‍රවර්ථන වර්ෂයේදී පොත්වලින් ඉවත්කරන ලද රු.162,194 ක් වූ පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. | පිළිගනිමි. 2020 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කරමි. |
| (ඕ) | භෞතිකව ගබඩාවේ නොපවතින වටිනාකම රු.306,989 ක ගබඩා ද්‍රව්‍ය තොගයක් තොග ගිණුමෙහි ඇතුළත්කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. | මෙලෙස දක්වන ගබඩා ද්‍රව්‍ය තොගයක් නොමැති බැවින් 2020 ගිණුමෙන් නිවැරදි කරමි. |

### 1.3.2 **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩකුලී ගිණුමේ හා විවිධ තැන්පත් ගිණුමේ ශේෂ අදාළ උපලේඛන සමග සැසඳීමේදී රු.157,212 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවීම. | නිවැරදි ශේෂය ගිණුම්ගත කොට මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.55,933,798 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. | මෙය 2003 වසරට අදාළවේ. එම වටිනාකම සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි බව කාරුණිකව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති රීති, රෙගුලාසි හා කළමනාකරන ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | | |
| | රු. | | | |
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා ආඥ පනතේ 127 වගන්තිය | - | සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමි 05ක් පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සුසාන භූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | සභාව සතු සුසාන භූමි 5හි සීමා නිර්ණයන් කටයුතු අවසන් කර ඇති අතර, සභාව වෙත පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලද විගස සභාව වෙත පවරා ගෙන ගැසට් කිරීමේ කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 571 | 3,211,549 | වර්ෂ 02 ඉක්ම වූ රු.118,263ක තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නොගෙවූ වැටුප් සහා ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| වෙනත් චක්‍රලේඛ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 3/2015 | 600,000 | විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා අතුරු අග්‍රිමයක් ලබා දියහැකි වුවද මාණ්ඩලික නොවන නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 6 කදී රු.100,000 බැගින් අග්‍රිම නිකුත්කර තිබුණි. | මාණ්ඩලික නිලධාරීන්ට පමණක් තත්කාර්ය අත්තිකාරම් නිකුත් කළ යුතුවේ. | අත්තිකාරම් ලබාදීම හැකිතාක් දුරට මාණ්ඩලික නිලධාරියා මගින්ම සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.79,372,839 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.96,343,250 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) මහජන බැංකුවේ අංක 098-1-001-8-3913967 දරන ගිණුමේ බැංකු සැසඳුම් විස්තරය අනුව වසර 10කට වැඩි කාලයක් දිගටම පැවත එන රු.202,518 ක උපලබ්ධි නොවූ තැන්පතු පැවතුණි. | උපලබ්ධි නොවූ තැන්පත් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | 2005 වර්ෂයේ සිට පැවත එන උපලබ්ධි නොවූ රු.202,518ක අගය සොයා ගැනීමට හැකියාවක් නොමැති බැවින්, පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ලබාගෙන කටයුතු කරමි. |
| (ආ) අගරු චෙක්පත් ගිණුමේ, පැවති රු.142,763 ක ශේෂය වර්ෂය අවසාන දින වනවිටත් නිරවුල් කර නොතිබුණි. | අගරු චෙක්පත් නිරවුල් කර ගත යුතුවීම. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කරමි. |
| (ඇ) මහජන බැංකුවේ පැරණි ජංගම ගිණුමේ රු.47,533 ක ශේෂයක් වසර ගණනාවක සිට අක්‍රියව පැවතුණි. | අක්‍රීය ගිණුම් අවසන් කරගත යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවල පවතින මෙම අගය ඉවත්කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කරතිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කිරීම් | රැස්කල ආදායම | 2019 දෙසැ.31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කිරීම් | රැස්කල ආදායම | 2018දෙසැ.31 දිනට සමුච්චිත හිඟය |
| | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. | '000 රු. |
| (i) වරිපනම් හා බදු | 59,438 | 46,223 | 52,151 | 43,132 | 53,472 | 46,575 | 49,929 | 43,972 |
| (ii) කුලී | 4,235 | 6,102, | 10,901 | 3,352 | 11,643 | 3,154 | 606 | 3,524 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,020 | 1,220 | 1,220 | - | 1,072 | 697 | 697 | - |
| (iv) වෙනත් ආදායම් | - | 78,928 | 78,928 | - | - | 97,406 | 97,406 | - |
| එකතුව | 64,693 | 132,473 | 143,200 | 46,484 | 66,187 | 147,832 | 148,638 | 47,496 |

2.3.2 **වරිපනම් බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී මුළු වරිපනම් බදු අයකර ගැනීම් වලින් සියයට 41 ක් හිඟ අයකිරීම් ද, සියයට 56 ක් ප්‍රවර්ථන අයකිරීම් ද වූ අතර වර්ෂයේ අවසාන දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 43ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | පිළිගනිමි. හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.3.3 **කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| පැරණි වෙළඳ පොලෙහි පිහිටි කඩ 8 කින් හා වෙළඳ සංකීර්ණ 5 ක කඩ 108 කින් 2019 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කඩ කුලිය රු.3,410,564 ක් විය. ප්‍රවර්ථන වර්ෂයේදී කිසිදු කුලී මුදලක් අයවී නොතිබුණු කඩ 11කින් වර්ෂය අවසාන දිනට අයවිය යුතු මුළු හිඟ කුලිය රු.730,185 ක් විය. | නොපමාව හිඟ කඩකුලී අය කළ යුතුවීම. | ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාලයේ කඩ කුලී නිවැරදි ශේෂය රු.4,016,906 ක් වන අතර, එම ශේෂය ගිණුම හා නොගැළපේ. ඊට හේතුව කඩ කුලී වාර්ෂික බිල් කිරීම් සිදු කිරීමේදී සිදුව ඇති වරදකි. 2020 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරමි. |

2.3.4 **උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| පසුගිය වසර 05 ක සිට සභාව කිසිදු උසාවි දඩ ආදායමක් අයකර ගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට උසාවි දඩ රු.24,000,000 ක් ලැබිය යුතුව තිබුණි. | නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | පසුගිය වර්ෂයන්ට අදාළව සභාවට ලැබිය යුතු උසාවි දඩ සම්බන්ධයෙන් පරීක්ෂා කර ඊට අදාළ වාර්තා නැවත පරීක්ෂා කිරීමට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කර ඇත. මෙතෙක් එකී වාර්තා පරීක්ෂා කර සභාව වෙත යොමුකර නැත. |

## 3 **මෙහෙයුම් සමාලෝචනය**

### 3.1 **කාර්යයසාධනය**

ප්‍රාදේශීය සභා ආඥා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත වටිනාකම රු.3,706,236ක් වූ යෝජිත අතුරු මාර්ග 09ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |

(ආ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සභාව විසින් කොම්පොස්ට් අංගනයක් පවත්වාගෙන ගොස් තිබුණද එය බලප්‍රදේශයේ සමස්ථ දිරන කසළ කොම්පෝස්ට්කරණය සඳහා ප්‍රමාණවත් නොවුණු බැවින් කොම්පොස්ට් අංගනය පුළුල් කිරීම හෝ කසළ උපයෝගී කරගෙන ජීව වායු නිපදවීමේ තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම් පුළුල් කිරීමට කටයුතු සිදුකිරීම. | කොම්පොස්ට් අංගනයක් පුළුල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සභාව සතුව නොමැති වීම ගැටළුවක් වී ඇත. දිරන කසළ උපයෝගී කරගෙන පෞද්ගලික අංශයේ සහයද ලබාගෙන ජීව වායු නිපදවීමේ හැකියාව පිළිබඳව සොයා බලා ඉදිරියේදී විධිමත් ක්‍රමවේදයක් සැළසුම් කිරීමට කටයුතු කරමි. |

3.2 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරුවල පුරප්පාඩු 11 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ආ) සේවය අත්හිටුවා තිබූ සේවකයින් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු.237,442 ක ණය ශේෂයෙන් ප්‍රවර්ථන වර්ෂයේදී කිසිදු ණය මුදලක් අය කර නොතිබුණි. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | සභාවේ විනය නියෝග මත සේවය අත්හිටුවා ඇති ඩී.සී.පී.හත්තොටුව මහතාගෙන් අයවිය යුතු රු.108,250 ක මුදලත්,සේවය හැර ගොස් ඇති එම්.වී.ඩී විජිත මහතාගේ රු.129,492 ක මුදලත් අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමුකර ඇත. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොදු පහසුකම් සඳහා සභාවට ලැබී තිබුණු අක්කර 02 පර්චස් 18 ක විශාල ඉඩම 2016 ජුනි 30 දින වර්ෂයක කාලයක් සඳහා මාලඹේ ආදර්ශ පිරිමි විද්‍යාලයේ ක්‍රීඩාංගණය ලෙස භාවිතා කිරීමට අවබෝධතා ගිවිසුමකින් ලබා දී තිබුණි. එහෙත් ගිවිසුම අවලංගු වී වර්ෂ 02ක් ගත වී තිබුණද ඉඩම ආපසු ලබා ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම දේපළ සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | 2016 වර්ෂයේදී ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමක් මත ක්‍රීඩා කටයුතු සඳහා වසර 01ක කාලයක් සඳහා එම ක්‍රීඩාංගනය විදුහල වෙත ලබා දී තිබුණද ගිවිසුම් ගත කාලය අවසන් වුවත් අවස්ථා ගණනාවකදීම ක්‍රීඩාංගනය නැවත භාර නොදීම නිසා එහි මැනුම් කටයුතු කර සභාව සතු දේපළක් බවට දැන්වීම් පුවරුවක් සවි කිරීමට කටයුතු කිරීමට විදුහලේ විරෝධතාවයන් මත එය ඉටුකරලීමට නොහැකි විය. |

3.4 **නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු.5,850,000 ක් වූ කැබ් රථ 03ක්, ට්‍රැක්ටර් 04ක් සහ වටිනාකම සොයාගත නොහැකි වූ අත් ට්‍රැක්ටරයක් ප්‍රාදේශිය සභාවේ උපකාර්යාල භූමියේ දිරාපත් වෙමින් පැවති අතර මෙම වාහන අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වීම. | කැබ් රථ 03 වෙනත් රාජ්‍ය ආයතන වල ඉල්ලීම මත එම ආයතන වෙත ලබා දීමට හා අත් ට්‍රැක්ටරය අපහරණය කිරීමටත් නිර්දේශ වී ඇත. |

4 **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත, පොදු පහසුකම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | යොමුගත අංශයන් කෙරේ ඉහළ කළමනාකරණයේ විශේෂ අවධානය යොමුකළ යුතුවීම. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කොට කටයුතු කරන බව දන්වමි. |